www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපයේ සසප සාමාජිකයන්ට එරෙහි එල්ටීටීඊයේ තර්ජන හා ප්‍රචණ්ඩ ක්‍රියාවලට විරුද්ධ වනු!

## Oppose LTTE campaign of threats and violence against SEP supporters in Europe!

**2009 මාර්තු 9**

හතරවන ජා.ය්න්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය (සසප) ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අගය කරන සියල්ලන්ගෙන්, දෙමල හා දෙමල සංවිධාන ද ඇතුලු, ඉල්ලා සිටින්නේ, යුරෝපයේ අප සාමාජිකයන්ට හා ආධාරකරුවන්ට එරෙහිව එල්ලකරන තර්ජන හා ප්‍රචණ්ඩ කියා නතර කරන ලෙස, එල්ටීටීඊය සිය නියෝජිතයන්ට උපදෙස් දිය යුතු බවට බලකරන ලෙසයි.

පෙබරවාරි 4 දින ලංඩන්, බර්ලින් හා පැරිසියේ පවත්වන ලද පෙලපාලිවලදී ද පෙබරවාරි 7 දින ස්ටුට්ගාට්හි පැවති රැලියේදී ද සසප ආධාරකරුවන්ට පත්‍රිකා බෙදීම නතර කර පිටව යන ලෙසට තර්ජනය කර ඉවතට තල්ලු කර හරිමින් සිංහල විරෝධී වර්ගවාදී භාෂාවෙන් බැන වැදුන විවිධ එල්ටීටීඊ හිතවාදී සංවිධාන අතර comite de coordination tamoul en France (CCT) හා බ්‍රිතාන්‍යයේ දෙමල සංසදය (British Tmils Forum) ද විය.

ඊට සමගාමීව සීසීටී ආධාරකරුවන් විසින්, මාර්තු 15 දින පැවැත්වීමට නියමිත ප්‍රසිද්ධ රැස්වීම සඳහා පැරිසියේ ලා චැපල්හි උද්ඝෝෂනයක නිරතව සිටි සසප සාමාජිකයන්ගේ පත්‍රිකා උදුරාගෙන විනාශ කලහ. ''ලා චැපල්හි ජීවත්වන දෙමල ජාතිකයන් සමග දේශපාලනය කථාකල හැක්කේ තම අවසරය ලබා ඇති අයට පමනක්'' බව සීසීටී ක්‍රියාකාරීන් අනතුරු ඇඟවූහ.

මනා සම්බන්ධීකරනයක් සහිතව මෙම ප්‍රහාරයන්හි නිරතවූ අපරාධකරුවන් වැඩකලේ එල්ටීටීඊ උපදෙස් මතය.

සිය දෙමල දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව මිනීමරු ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම පිලිබඳ දශක ගනනාවක් දිග කුප්‍රකට ඉතිහාසයකට එල්ටීටීඊ ය උරුමකම් කියයි. දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් පිලිබඳ සාහසික නොතැකීමෙන් ගලා ආ ඝාතනයන්ද ඇතුලත් එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමයන්, දෙමල ජනතාවට එරෙහි යුද්ධයේදී ප්‍රතිගාමී ශ්‍රී ලංකා රාජ්‍යයේ අත ශක්තිමත් කලේය.

යුරෝපය තුල එල්ටීටීඊ ප්‍රචණ්ඩ ක්‍රියා පැතිර යමින් තිබේ. මාර්තු 7 සෙනසුරාදා 75 හෝ ඊට වැඩි එල්ටීටීඊ ආධාරකරුවන් කන්ඩායමක් ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල්, ප්‍රංශ ජනාධිපති නිකොලායි සාර්කෝසි හා එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමාගේ පිලිරූ ලෙලවමින් පැමිනි ඔවුන්, දෙමල ජනතාව මඬින ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව විරෝධතාවයේ යෙදුනු දෙමල හා ප්‍රංශ වාම කන්ඩායම්වල පෙලපාලිය කඩාකප්පල් කිරීමට උත්සාහ කලහ. එල්ටීටීඊ මැරයෙක් විරෝධතා කරුවන්ට පැවසුවේ ''අප හැරෙන්නට වෙනත් කිසිවෙකුට පෙලපාලි හෝ රැස්වීම් සංවිධානය කිරීමට අවසර නැති'' බවයි.

එල්ටීටීඊ යුරෝපීය නියෝජිතයන් ගෙන යන බියගැන්වීමේ ව්‍යාපාරය වනාහි ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කරන සාහසික ප්‍රහාරයකි. එයට දැඩි ලෙස විරුද්ධ විය යුතුය.

දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා පෙනී සිටීමේදී නොබිඳුනු හා සුප්‍රකට වාර්තාවක් සසප සතුව ඇති තත්වය හමුවේ එල්ටීටීඊ සසප ඉලක්ක කිරීම විශේෂයෙන්ම ප්‍රකෝපකාරීය.

රාජ්‍ය ප්‍රහාර හා සිංහල ස්වෝත්තමවාදී ප්‍රචණ්ඩත්වය හමුවේ සසප, ධනේශ්වර රාජ්‍යයේ ආධිපත්‍යය දරන ප්‍රතිගාමී සිංහල ප්‍රභූ පැලැන්තිය පෙරලා දමා, සියල්ලන්ගේම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා මූලික සමාජ අවශ්‍යතා සහතික කල හැකි, ශ්‍රී ලංකා ඊලම් එක්සත් සමාජවාදී රාජ්‍යයන් ගොඩනැගීමේදී, සිංහල දෙමල හා මුස්ලිම් කම්කරු පන්තිය හා ගොවි ජනතාව එකමුතු කිරීමේ තීරනාත්මක ප්‍රථම පියවර වශයෙන්, උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා හමුදාව වහාම හා කොන්දේසි විරහිතව ඉවත්කර ගත යුතු යයි සසප අඛන්ඩව ඉල්ලා තිබේ.

එල්ටීටීඊ ප්‍රචණ්ඩත්වය යොදාගැනීමට උත්සාහ දරන්නේ, දේශපාලන විවේචන වලට පිලිතුරු දීමට හා එහි දක්ෂිනාංශික ප්‍රතිපත්තීන් හා දෙමල සංක්‍රමනික කම්කරුවන් හා තරුනයන් අතර ඔවුන් ගෙන යන ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම පිලිබඳව වර්ධනය වන

විරෝධය කෙරෙහි ඇති බිය නිසාය. එල්ටීටීඊ දේශපාලනය හා, ඊට එකතු කල යුතු, ඔවුන්ගේ සුවිශේෂී ක්‍රියා පටිපාටිය, දෙමල ව්‍යාපාරික ප්‍රජාව අතර ඔවුන්ගේ දේශීය නියෝජිතයන්ගේ වානිජ්‍ය අවශ්‍යතාවන් සමඟ දැඩි ලෙස බැඳී ඇත.

තමන් දෙමල ජනතාවගේ එකම නියෝජිතයාය යන එල්ටීටීඊ කියාපෑම, දෙමල ජනතාව ''මුදාගන්නා'' ලෙසට එක්සත් ජනපද, බ්‍රිතාන්‍ය හා අනෙකුත් බටහිර බලවත් රටවල ආන්ඩුවලට මෙන්ම ඉන්දියාවට ද ඔවුන් කරන ශෝචනීය හා ගැත්තර ආයාචනා හමුවේ විකාරයක් බවට පත්වෙයි. තම සමාජවාදී විරුද්ධවාදීන්ට අත දිගහැර පහර දෙන එල්ටීටීඊය, දෙමල ජනතාවට එරෙහි වර්ගවාදී යුද්ධයක නිරතව සිටින සිංහල ධනපති ආන්ඩුවට අනුබලය හා ආධාර දෙන අධිරාජ්‍යවාදී රටවල් කෙරෙහි සිය විශ්වාසය රඳවන ලෙස දෙමල ජනතාවට බල කරති.

එල්ටීටීඊයේ ජාතිකවාදී දේශපාලනයත්, ප්‍රජාතන්ත්‍ර විරෝධී උපාය මාර්ගත්, අත්වැල් බැඳගෙන එකට ගමන් කරයි. උතුරු=නැගෙනහිර ධනේශ්වර රාජ්‍යයක් කපා වෙන්කර ගැනීමේ එහි අභිලාෂයත්, මහා බලවතුන් එකෙකුගේ හෝ ගනනාවකගේ අනුග්‍රහය බලාපොරොත්තු වීමත් පෙන්නුම් කරන්නේ, විදේශගතව සිටින හෝ වන්නි ප්‍රදේශයේ දිගු කලක් තිස්සේ පවත්වාගෙන යන මර්ධනකාරී තන්ත්‍රය යටතේ ජීවත් වන,  දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි එල්ටීටීඊ දක්වන සතුරු කමයි.

එලටීටීඊයේ දේශපාලන ඉදිරිදර්ශනයෙහි බංකොලොත් කමත්, දෙමල ජනතාවගේ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රීය හා සමානාත්මතා අභිලාෂයන් සමඟ එහි හැප්පීමත් අවසාන වශයෙන් සනාථවී තිබේ. බියගැන්වීමෙන් හා ප්‍රචන්ඩත්වය යොදා ගැනීමෙන් එල්ටීටීඊ සිය අධිකාරය පවත්වා ගැනීමට උත්සාහ කරන අතර, එම විධි ක්‍රමයන්ට විරුද්ධවී එය හෙලා දැකිය යුතුය.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් රැක ගැනීමට උනන්දුවක් දක්වන සියල්ලන්, දෙමල ප්‍රජාව තුල දේශපාලන වාද විවාද මැඬීමට දරන එල්ටීටීඊ ව්‍යායාමය හා , සසප සාමාජිකයන්ට හා ආධාරකරුවන්ට එරෙහි එහි සියලු තර්ජන හා බලහත්කාරය වහාම නතර කරන ලෙසට බලකල යුතුය.

එල්ටීටීඊ වැඩකටයුතු වලට විරෝධය පලකරන හා එය වහා අත්හිටුවන ලෙස ඉල්ලන ලිපි පහත ලිපිනයන්ට යොමුකරන්න.

Comite de coordination tamoul en France
341, rue des Pyrenees
75020-Paris, France
Fax: + 33 1 4358119

Tamil Confederation - Germany
Postfach 340251
51601 Gummersbach
Germany

British Tamils Forum
165 The Broadway
Wimbledon, London
SW 19 1NE
United Kingdom

E-mail admin@tamilsforum.com

.

.

.

© www.wsws.org